# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2006 අංක 18 දරන කොන්සල් කර්තව්‍ය (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2006 මැයි මස 18 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

2006 මැයි මස 19 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පල කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

මිළ : රු.12.25 යි. තැපැල් ගාස්තුව : රු. 7.50 යි.

# 2006 අංක 18 දරන කොන්සල් කර්තව්‍ය (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2006 මැයි මස 18 වන දින]

එල්.ඩී.—ඕ. 74/2003.

**කොන්සල් කර්තව්‍ය පනත සංශෝධනය කිරීම සඳහා ද කොන්සල් සම්බන්ධතා පිළිබඳ වියනා සම්මුතිය බලාත්මක කිරීම සඳහා විධිවිධාන ඇතුළත් කිරීම සඳහා ද ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :–

**1**. මේ පනත 2006 අංක 18 දරන කොන්සල් කර්තව්‍ය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2**. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1981 අංක 4 දරන කොන්සල් කර්තව්‍ය පනතේ දීර්ඝ නාමය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන දීර්ඝ නාමය ආදේශ කිරීමෙන් ඒ පනත මෙයින් සංශෝධනය කරනු ලැබේ :– 1981 අංක 4 දරන පනතේ දීර්ඝ නාමය ප්‍රතියෝජනය කිරීම.

"කොන්සල් සම්බන්ධතා පිළිබඳ වියනා සම්මුතිය බලාත්මක කිරීම සඳහා ද, ශ්‍රී ලංකාවේ තානාපති හෝ කොන්සල් නිලධරයන් විසින් විදේශීය රටවල දී ක්‍රියාත්මක කරනු ලබන කොන්සල් කර්තව්‍ය පාලනය කිරීම සඳහා නෛතික පාලනයක් ලබාදීම සහ විදේශීය රටවල කොන්සල් නිලධරයන්ට ලබා දී ඇති මුක්තයන් වරප්‍රසාද සහ කර්තව්‍ය ශ්‍රී ලංකාව තුළ ප්‍රදානය කිරීම පාලනය කිරීම සඳහා ද ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි."

**3**. ප්‍රධාන ප්‍රඥප්තියේ පැනවීමේ වගන්තිය වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් ප්‍රධාන ප්‍රඥප්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :– ප්‍රධාන ප්‍රඥප්තියේ පැනවීමේ වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"පූර්විකාව

එක්දහස් නවසිය හැට තුනේ අප්‍රේල් මස විසිහතර වැනි දින කොන්සල් සම්බන්ධතා පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මේලනය මගින් (මෙහි මින් මතු "සම්මුතිය" යනුවෙන් සඳහන් කරනු ලබන) කොන්සල් සම්බන්ධතා පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියක් වියනා හි දී සම්මත කරගනු ලැබූ හෙයින් ද ;

ඉහත කී සම්මුතිය එක් දහස් නවසිය හැට හතේ මාර්තු මස දහනව වෙනි දින සිට බලාත්මක වූ හෙයින් ද :

ශ්‍රී ලංකාවේ ආණ්ඩුව වෙනුවෙන් එක්සත් ජාතීන්ගේ මහලේකම්වරයා වෙත "ප්‍රවේශ වීමේ සාධන පත්‍රයක්" තැන්පත් කිරීම මගින් ඉහත කී සම්මුතියට අනුකූලව ක්‍රියා කිරීමට ශ්‍රී ලංකාව අදහස් කර සිටින බැවින් ද :

ඉහත කී සම්මුතිය යටතේ ශ්‍රී ලංකාවේ වගකීම් බලාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින් නෛතික විධිවිධාන සැලැස්වීම අවශ්‍ය වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—".

ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තියට පෙර ශීර්ෂය ඇතුළත් කිරීම.

**4**. ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තියට පෙරාතුව ම පහත දැක්වෙන ශීර්ෂය ඇතුළත් කිරීම මගින් ප්‍රධාන ප්‍රඥප්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"I වන කොටස

කොන්සල් සබඳතා පිහිටුවීම හා කොන්සල් කර්තව්‍ය හඳුනා ගැනීම".

ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**5**. ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"කොන්සල් සම්බන්ධතා පිහිටුවීම සහ කොන්සල් කර්තව්‍ය ඉටුකිරීම සඳහා කොන්සල් නිලධරයන්ට බලය පැවරීම.

2. (1) මේ පනතේ කාර්ය සඳහා, රාජ්‍ය දෙකක් අතර තානාපති සම්බන්ධතා පිහිටුවා ගැනීමෙන් පසු කොන්සල් සම්බන්ධතා පිහිටුවාගෙන ඇති ලෙස සලකනු ලැබිය යුතු ය. බාර ගන්නා රාජ්‍යයේ දේශසීමාව තුළ කොන්සල් ධුරයක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) කොන්සල් සම්බන්ධතා පිහිටුවා ගැනීමෙන් පසු, කොන්සල් කර්තව්‍ය කොන්සල් ධුරය දරන්නා හරහා කොන්සල් නිලධරයකු විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය :

එසේ වුව ද, සම්මුතියේ විධිවිධානවලට අනුකූලව, කොන්සල් කර්තව්‍ය තානාපති දූත මණ්ඩල විසින් ද ඉටු කරනු ලැබිය හැකි ය.

(3) සෑම කොන්සල් නිලධරයකුට ම, තමා පිළිගනු ලැබූ හෝ පත් කරනු ලැබූ විදේශීය රටක් තුළ දී, යම් ලිඛිත නීතියකට අනුකූලව යම් කොන්සල් කර්තව්‍යයක් හෝ සම්මුතිය ප්‍රකාරව හඳුනාගනු ලැබූ සහ උපලේඛනයේ දක්වා ඇති යම් කොන්සල් කර්තව්‍යයක් ඉටුකිරීම සඳහා බලය පවරනු ලැබේ. එසේ වුව ද, එම කාර්ය ඉටුකිරීම එම විදේශීය රටේ නීති මගින් තහනම් කරනු ලැබ නොතිබිය යුතු ය.

(4) කොන්සල් ධුරයක් දරන කොන්සල් නිලධරයකු විසින්, උපලේඛනයේ දක්වා ඇති කර්තව්‍යවලට අමතරව ප්‍රධාන ප්‍රඥප්තියේ 3, 4, 5, 6 සහ 7 යන වගන්තිවල දක්වා ඇති කර්තව්‍ය ඉටුකරනු ලැබිය යුතු ය.

(5) සෑම කොන්සල් ධුරයක් සඳහා ම කොන්සල් පරිශ්‍රයක් තිබිය යුතු අතර එම පරිශ්‍රයේ සිට කොන්සල් ධුරය දරන්නා විසින් සිය කොන්සල් කර්තව්‍ය ඉටු කළ යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියට අලුතින් 2අ වගන්තිය ඇතුළත් කිරීම.

**6**. ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය ප්‍රධාන ප්‍රඥප්තියේ 2අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය :-

"කොන්සල් නිලධරයන් විසින් තානාපති කාර්ය ඉටුකිරීම.

2අ. යවන රාජ්‍යයට විදේශ දූත මණ්ඩලයක් නොමැති අවස්ථාවක දී සහ තුන්වන රාජ්‍යයක විදේශ දූත මණ්ඩලයක් විසින් නියෝජනය කරනු නොලබන අවස්ථාවක, බාර ගන්නා රාජ්‍යයේ කැමැත්ත ඇතිව සහ ස්වකීය කොන්සල් තත්වයට හානියක් නොමැතිව, තානාපති කාර්ය ඉටුකිරීම සඳහා කොන්සල් නිලධරයකුට බලය පවරනු ලැබිය හැකි ය :

එසේ වුව ද එවැනි කාර්ය ඉටුකිරීම මගින් එම කොන්සල් නිලධරයාට කිසිදු ආකාරයකින් තානාපති වරප්‍රසාද සහ මුක්තයන් සඳහා හිමිකම්පෑමේ අයිතියක් නොපැවරේ. ".

ප්‍රධාන ප්‍රඥප්තියට II වන කොටස සහ III වන කොටස ඇතුළත් කිරීම.

**7**. ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් කොටස් මෙයින් ඇතුළත් කරනු ලබන අතර එම කොටස් ප්‍රධාන ප්‍රඥප්තියේ II වන කොටස (7අ, 7ආ, 7ඇ, 7ඈ, 7ඉ, 7ඊ, 7උ, 7ඌ, 7එ, 7ඒ, 7ඔ, 7ඕ, සහ 7ක, යන වගන්ති) සහ III වන කොටස (7ග, 7ච, 7ජ, 7ට, 7ඩ, 7ණ, 7ත, සහ 7ද, යන වගන්ති ) ලෙස බලාත්මක විය යුතු ය :–

"II වන කොටස

**ශ්‍රී ලංකාවේ වෘත්තීය කොන්සල් තනතුරුවලට අදාළ මුක්තීන්, පහසුකම් සහ වරප්‍රසාද**

කොන්සල් පරිශ්‍රයට අනතුරු හෝ පීඩා නොකළ යුතු බව.

7අ. (1) ශ්‍රී ලංකාවේ කොන්සල් ධුරයේ කර්තව්‍ය ඉටුකිරීම සඳහා බාර ගන්නා රාජ්‍යය විසින් සම්පූර්ණ පහසුකම් සැලසිය යුතු ය.

(2) කොන්සල් ධුරයක් දරන තැනැත්තා විසින් සිය කර්තව්‍ය ඉටුකරනු ලබන කොන්සල් පරිශ්‍රය, මෙහි මින් මතු විධිවිධාන සලසන පරිදි, අනතුරු හා පීඩා වලින් නිදහස් විය යුතු ය.

(3) යවන රාජ්‍යයේ කොන්සල් ධුරයේ ප්‍රධානියාගේ කැමැත්ත ඇතිව මිස, කොන්සල් ධුරයේ කටයුතුවල කාර්ය සඳහා අනන්‍ය ලෙස භාවිත කරනු ලබන කොන්සල් පරිශ්‍රයේ කොටසට, බාර ගන්නා රාජ්‍යයේ බලධරයන් ඇතුළු නොවිය යුතු ය.

(4) බලෙන් ඇතුලුවීම සහ අලාභ සිදු කිරීමට එරෙහිව කොන්සල් පරිශ්‍රය ආරක්ෂා කිරීම සඳහා සහ කොන්සල් ධුරයට යම් බාධාවක් සිදුකිරීම වැළැක්වීම සඳහා බාර ගන්නා රාජ්‍යය උචිත පියවර ගත යුතු ය.

බදුවලින් නිදහස් කිරීම.

7ආ. යවන රාජ්‍යයේ කොන්සල් ධුරයට අදාළ නිවස සහ යවන රාජ්‍යයේ කොන්සල් පරිශ්‍රය කවර හෝ මට්ටමක ජාතික බදු කරණයකින් නිදහස් විය යුතු ය. එසේ වුව ද, එසේ නිදහස් කිරීම, ලබාදෙන ලද නිශ්චිත සේවා සම්බන්ධයෙන් නියම කර ඇති ගෙවීම්වලට ව්‍යාප්ත නොවිය යුතු ය.

කොන්සල් රාජ්‍ය ලේඛනවලට අනතුරු හෝ පීඩා නොකළ යුතු බව.

7ඈ. කොන්සල් ධුරයට අදාළ කොන්සල් රාජ්‍ය ලේඛන අනුලංඝනීය විය යුතු ය.

බාර ගන්නා රාජ්‍යය තුළ ඇවිදීමේ නිදහස.

7ඇ. කොන්සල් ධුරයට අදාළ සියලුම සාමාජිකයන්ට බාර ගන්නා රාජ්‍යය ඇතුළත ගමන් කිරීමේ සහ සංචාරය කිරීමේ නිදහස තිබෙන බවට බාර ගන්නා රාජ්‍යය සහතික විය යුතු ය. එසේ වුවද, මෙම නිදහස ජාතික ආරක්ෂාව පිළිබඳ හේතු සඳහා පනවන ලද යම් සීමා කිරීම් වලට යටත් විය යුතු ය.

සන්නිවේදනයේ නිදහස.

7ඉ. (1) කොන්සල් ධුරයේ සියලුම නිල කාර්ය සඳහා එම ධුරයට අදාළ සංනිවේදනයේ නිදහස බාර ගන්නා රාජ්‍යය විසින් සහතික කොට ආරක්ෂා කළ යුතු ය. කොන්සල් ධුරය විසින් සිය කර්තව්‍ය ඉටු කිරීමේදී සංනිවේදන කටයුතු සඳහා උචිත සංනිවේදන ක්‍රම උපයෝගී කර ගත හැකි ය.

(2) කොන්සල් ධුරයේ කොන්සල් කර්තව්‍ය ඉටුකිරීමට අදාළ කොන්සල් ධුරයේ නිල ලිපි ගනුදෙනු අනුලංඝනීය විය යුතු ය.

(3) කොන්සල් බෑගය විවෘත කිරීම හෝ රඳවා තබා ගැනීම නොකළ යුතු අතර එම බෑගයෙහි නිල භාවිතය සඳහා අනන්‍ය ලෙස භාවිත කිරීමට අදහස් කරනු ලබන නිල ලිපිගොනු සහ ලේඛන හෝ භාණ්ඩ පමණක් අන්තර්ගතව තිබිය යුතු ය. එසේ වුව ද, එම බෑගයේ නිල ලිපි ලේඛන නොවන වෙනත් ද්‍රව්‍ය ඇති බවට බාර ගන්නා රාජ්‍යයේ අදාළ බලධරයන්ට සාධාරණ සැකයක් ඇත්නම්, එම නිලධරයන් ඉදිරිපිට දී යවන රාජ්‍යයේ බලයලත් නියෝජිතයකු විසින් එම බෑගය විවෘත කරන ලෙස එම බලධරයන් විසින් ඉල්ලා සිටිනු ලැබිය හැකි ය. එම ඉල්ලීම ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත්, එම බෑගය කලින් තිබූ ස්ථානය වෙත වහාම ආපසු ලබා දිය යුතු ය.

(4) කොන්සල් බෑගය රැගෙන යාම භාරව සිටින කොන්සල් කුරියර් සේවයට, ඔහුගේ තත්ත්වය සහ කොන්සල් බෑගය සංයුක්ත වන ඇසුරුම් ප්‍රමාණය සඳහන්

වන නිල ලේඛනයක් ලබා දිය යුතු ය. එසේ වුව ද, කොන්සල් බෑගය රැගෙන එනු ලබන නැවේ හෝ ගුවන් යානයේ ගුවන් නියමුවාගෙන් හෝ නෞකාධිපතිගෙන් එම බෑගය කෙළින්ම ලබාගැනීම සඳහා කොන්සල් ධුරයේ එක් සාමාජිකයෙක් යවනු ලැබිය යුතු ය.

යවන රාජ්‍යයේ ජාතිකයන් සමඟ සාකච්ඡා කිරීමට කොන්සල් නිලධරයන්ට ඇති අයිතිය.

7ඊ. (1) යවන රාජ්‍යයේ ජාතිකයන් සමග නිදහසේ අදහස් හුවමාරු කර ගැනීමේ අයිතිය සහ එම ජාතිකයන් වෙත ප්‍රවේශ වීමේ අයිතිය කොන්සල් නිලධරයකුට ඇති අතර ඒ ආකාරයටම යවන රාජ්‍යයේ ජාතිකයන්ට ද යවන රාජ්‍යයේ කොන්සල් නිලධරයන් වෙත එවැනිම ප්‍රවේශයක් සහ එම නිලධරයන් සමග අදහස් හුවමාරු කර ගැනීමේ නිදහස ද තිබිය යුතු ය.

(2) යවන රාජ්‍යයේ ජාතිකයකු සිරභාරයට ගනු ලැබුවහොත් හෝ බන්ධනාගාරගත කරනු ලැබුවහොත් හෝ නඩු විභාගයක් පවත්වන තුරු අත්අඩංගුවට ගනු ලැබුවහොත් හෝ යම් ආකාරයකින් රඳවා තබා ගනු ලැබුවහොත්, බාර ගන්නා රාජ්‍යයේ බලධරයන් විසින් වහාම ඒ බව යවන රාජ්‍යයේ කොන්සල් ධුරය වෙත දැනුම් දිය යුතු ය. එසේ වුවද, එවැනි අවස්ථාවල දී බාර ගන්නා රාජ්‍යයේ නීති සහ නියෝගවලට යටත්ව, එම ජාතිකයන් හමුවීමේ, ඔවුන් සමග සාකච්ඡා කිරීමේ හෝ ලිපි හුවමාරු කිරීමේ සහ අවශ්‍ය අවස්ථාවලදී එම ජාතිකයන් සඳහා නීති නියෝජිතයන් ලබාදීමේ අයිතිය කොන්සල් නිලධරයන්ට තිබිය යුතු ය ;

තොරතුරු, යවන රාජ්‍යයේ කොන්සල් නිලධරයා වෙත ලබා දිය යුතු බව.

7උ. (අ) යවන රාජ්‍යයේ ජාතිකයකු මිය යාමට අදාළ තොරතුරු ;

(ආ) යවන රාජ්‍යයේ ජාතිකයකු වන බාලවයස්කාර තැනැත්තකු හෝ සිහිවිකල් තැනැත්තකු සඳහා ආරක්ෂකයකු හෝ භාරකරුවකු පත් කිරීමේ අවශ්‍යතාවය ;

(ඇ) යවන රාජ්‍යයේ නෞකාවකට හෝ ගුවන් යානයකට අදාළ යම් සුන්බුන් හෝ අනතුරකට අදාළ තොරතුරු,

අදාළ කොන්සල් ධුරය වෙත දැනුම්දීම අදාළ බාර ගන්නා රාජ්‍යයේ බලධාරීන්ගේ කාර්යය වන්නේ ය.

අදාළ බලධරයන් සමග සන්නිවේදනය.

7ඍ. කොන්සල් නිලධරයන් විසින් තම කොන්සල් කර්තව්‍ය ඉටු කිරීම භාරගන්නා රාජ්‍යයේ නීති සහ නියෝගවලින් අවසර දෙන තාක් දුරට, එම කර්තව්‍ය ඉටුකිරීමට අදාළ සියලු කරුණු සම්බන්ධයෙන් බාර ගන්නා රාජ්‍යයේ අදාළ බලධරයන් සමග සාකච්ඡා කිරීමේ අයිතිය යවන රාජ්‍යයේ කොන්සල් නිලධරයන්ට තිබිය යුතු ය.

කොන්සල් ගාස්තු සහ අයකිරීම්.

7එ. බාර ගන්නා රාජ්‍යයේ දේශ සීමාවන් ඇතුළත සිය කොන්සල් කර්තව්‍ය ඉටු කිරීම සඳහා ඒ සම්බන්ධයෙන් නියම කර ඇති ගාස්තු සහ අයකිරීම් කොන්සල් ධුරය විසින් අයකරනු ලැබිය හැකි ය. ගාස්තු සහ අයකිරීම් වශයෙන් එසේ අයකරගනු ලබන මුදල් බාර ගන්නා රාජ්‍යයේ සියලුම අයකිරීම් සහ බදුවලින් නිදහස් විය යුතු ය.

කොන්සල් නිලධරයන්ට අනතුරු හා පීඩා නොකළ යුතු බව සහ ඔවුන් සිරභාරයට ගැනීම ආදියෙන් නිදහස් බව.

7ඒ. (1) සියලුම කොන්සල් නිලධරයන්ට සියලු අවස්ථාවන් හි දී ගෞරවයෙන් සැළකිය යුතු අතර කොන්සල් නිලධරයන් (බරපතල අපරාධයක් සිදු කිරීම සම්බන්ධයෙන් හැර සහ නිසි අධිකරණ බලය ඇති අධිකරණයක තීරණයක් අනුව මිස) සිරභාරයට ගැනීමට හෝ රඳවා තබාගැනීමට හෝ ඔවුන්ගේ නිදහස සීමා වන වෙනත් යම් ආකාරයක සීමා කිරීමකට හෝ ඔවුන් යටත් නොකළ යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් පරිදි කොන්සල් නිලධරයකු බරපතල වරදක් සඳහා සිරභාරයට ගනු ලබන හෝ රඳවා තබා ගනු ලබන අවස්ථාවක, ඒ කරුණ පිළිබඳව බාර ගන්නා රාජ්‍යය විසින් කොන්සල් ධුරයේ ප්‍රධානියා වෙත දැනුම් දිය යුතු ය. සිරභාරයට ගත් තැනැත්තා කොන්සල් ධුරයේ ප්‍රධානියා නම් ඔවුන් විසින් තානාපති කාර්යාලය හරහා ඒ බව යවන රාජ්‍යය වෙත දැනුම් දිය යුතු ය.

(3) කොන්සල් නිලධරයන් සහ කොන්සල් සේවා නියුක්තයන් සිය කොන්සල් කර්තව්‍ය ඉටු කිරීමේදී සිදු කරන ලද ක්‍රියා සම්බන්ධයෙන් එම නිලධරයන් හෝ සේවා නියුක්තයන් බාර ගන්නා රාජ්‍යයේ යම් අධිකරණයක අධිකරණ බලයට හෝ පරිපාලන අධිකාරියක බලයට යටත් නොකළ යුතු ය :

එසේ වුවද,

(අ) යවන රාජ්‍ය නියෝජිතයෙක් වශයෙන් හැර, කොන්සල් නිලධරයකු හෝ කොන්සල් සේවා නියුක්තයකු ඇතුළත් වූ යම් ගිවිසුමක් සම්බන්ධයෙන් ; හෝ

(ආ) බාර ගන්නා රාජ්‍යයේ දී සිදු වූ යම් අනතුරකින් පැනනගින තුන්වන පාර්ශ්වයේ අලාභයක් සම්බන්ධයෙන් කොන්සල් නිලධරයාට හෝ කොන්සල් සේවා නියුක්තයාට එරෙහිව පවරන ලද යම් සිවිල් නඩුවකට (3) වන උපවගන්තියේ විධිවිධාන අදාළ නොවිය යුතු ය.

(4) මේ වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධානවලින් සළසා ඇති පරිදි හැර, නිසි අධිකරණ බලය ඇති අධිකරණයක අවසාන නඩු තීන්දුවක බලපෑම ඇති අධිකරණ තීරණයක් ක්‍රියාවේ යෙදවීමේදී හැර, කොන්සල් නිලධරයන් බන්ධනාගාරගත කිරීම හෝ ඔවුන්ගේ පෞද්ගලික නිදහස වෙනත් යම් ආකාරයකින් සීමා කිරීමකට යටත් කරනු නොලැබිය යුතු ය.

(5) කොන්සල් නිලධරයකුට එරෙහිව අපරාධ නඩු කටයුත්තක් පවරනු ලැබූ අවස්ථාවක, නිසි බලධරයන් වෙත කැඳවනු ලැබූ විට, එම නිලධරයා එම බලධරයන් ඉදිරියේ පෙනී සිටිය යුතු ය : එසේ වුව ද, එම නිලධරයාගේ නිල තත්වය සැළකිල්ලට ගෙන ඔහුට නිසි ගරුත්වය ඇතිව සහ (1) වන උපවගන්තියේ විධිවිධානවලින් සළසා ඇති පරිදි හැර සහ සාරානුකූලව කොන්සල් කර්තව්‍ය ඉටු කිරීමට බාධා නොවන ආකාරයට එම නඩු කටයුතු පවත්වාගෙන යා යුතු ය.

(6) (1) වන උපවගන්තියේ සඳහන් අවස්ථානුගත කරුණු අනුව, කොන්සල් නිලධරයා රඳවා තබා ගැනීම අවශ්‍ය වන අවස්ථාවක, අවම ප්‍රමාදයක් සහිතව එම නිලධරයාට එරෙහිව නඩු කටයුතු පවරනු ලබන බවට බාර ගන්නා රාජ්‍යය වග බලාගත යුතු ය.

සාක්ෂිදීමට ඇති වගකීම.

7ඔ. කොන්සල් ධුරයේ සාමාජිකයන් අධිකරණමය නඩු කටයුතුවලට හෝ පරිපාලනමය පරීක්ෂණවලට සාක්ෂිකරුවන් ලෙස පැමිණෙන ලෙස කැඳවනු ලැබිය හැකි අතර තම නිල කර්තව්‍ය ඉටු කිරීම හා සම්බන්ධ යම් කරුණකට අදාළව හෝ යම් නිල ලේඛනයක් හෝ ලිපි ගණුදෙනුවක් ඉදිරිපත් කරන ලෙස ඔවුන්ට නියම කරනු ලැබූ විටදී හැර, සෙසු අවස්ථාවලදී සාක්ෂි දීම යම් කොන්සල් නිලධරයකු විසින් ප්‍රතික්ෂේප නොකළ යුතු ය.

වරප්‍රසාද සහ මුක්තයන් ඉවත් කිරීම.

7ඕ. කොන්සල් ධුරයේ සාමාජිකයකු සම්බන්ධයෙන් 7ඒ වගන්තියේ (1) වන සහ (3) වන උපවගන්ති සහ 7ඔ වගන්තියෙන් සලසා ඇති වරප්‍රසාද සහ මුක්තයන් ඉවත් කිරීම සම්බන්ධයෙන් යවන රාජ්‍යය විසින් බාර ගන්නා රාජ්‍යය වෙත ලිඛිත නිවේදනයක් යැවීම මගින් යවන රාජ්‍යය විසින් කවර හෝ අවස්ථාවක එම වරප්‍රසාද හෝ මුක්තයන් ඉවත් කරගනු ලැබිය හැකි ය.

නිදහස් කිරීම්.

7ක. (1) භාරගන්නා රාජ්‍යයේදී පිටස්තර පුද්ගලයන් ලියාපදිංචි කිරීම සහ නිවාස අවසර පත්‍ර සම්බන්ධයෙන් ඇති යම් වගකීමකින්, කොන්සල් නිලධරයන් සහ කොන්සල් සේවා නියුක්තයන් සහ ඔවුන්ගේ පවුලේ සාමාජිකයන් නිදහස් විය යුතු ය.

(2) යවන රාජ්‍යය සඳහා කොන්සල් ධුරයේ සාමාජිකයන් විසින් සපයනු ලබන සේවා සම්බන්ධයෙන් සමාජ ආරක්ෂණ අවශ්‍යතාවලින් කොන්සල් ධුරයේ සාමාජිකයන් සහ ඔවුන්ගේ පවුලේ සාමාජිකයන් නිදහස් විය යුතු ය.

(3) (අ) වක්‍ර බදු ;

(ආ) බාර ගන්නා රාජ්‍යයේ පිහිටි පෞද්ගලික නිශ්චල දේපළ මත අයවිය යුතු අයකිරීම් ;

(ඇ) අනුප්‍රාප්තවීමේ හෝ උරුමවීමේ ගෙවීම් ;

(ඈ) පෞද්ගලික ආදායම් මත අයකිරීම් හා බදු ;

(ඉ) නිශ්චිත සේවා මත අයකරගනු ලබන ගෙවීම් ; සහ

(ඊ) ලියාපදිංචි කිරීමේ ගාස්තු, උකස් කිරීමේ ගාස්තු, මුද්දර ගාස්තු සහ අධිකරණ වාර්තා ගාස්තු

සම්බන්ධයෙන් හැර, සියලුම අයකිරීම්වලින් සහ ගාස්තුවලින් කොන්සල් නිලධරයන් සහ කොන්සල් සේවා නියුක්තයන් සහ ඔවුන්ගේ පවුලේ සාමාජිකයන් නිදහස් විය යුතු ය.

(4) (අ) කොන්සල් ධුරයේ නිල භාවිතය සඳහා වන භාණ්ඩ ;

(ආ) තම ආයතනයේ භාණ්ඩ ඇතුළු කොන්සල් නිලධරයකුගේ හෝ ඔහුගේ පවුලේ සාමාජිකයන්ගේ පෞද්ගලික ප්‍රයෝජනය සඳහා වන භාණ්ඩ,

සම්බන්ධයෙන් ගබඩා කිරීමේ හෝ සමාන සේවා සඳහා වන ගාස්තු හැර, බාර ගන්නා රාජ්‍යය විසින් ස්වකීය නීතිවලට අනුකූලව සියලුම රේගු බදුවලින්, බදු සහ අදාළ ගාස්තුවලින් කොන්සල් නිලධරයන් සහ ඔවුන්ගේ පවුල් වල සාමාජිකයන් නිදහස් කරනු ලැබිය හැකි ය.

පරිභෝජනය සඳහා අදහස් කරනු ලබන භාණ්ඩ, බාර ගන්නා රාජ්‍යයේ රීති සහ නියෝග මගින් නියම කර ඇති ප්‍රමාණයන් නොඉක්මවිය යුතු ය.

(5) බාර ගන්නා රාජ්‍යය විසින් සියලුම පෞද්ගලික සේවාවලින් සහ යුදමය වගකීම් සහ දායකවීම්වලින් කොන්සල් ධුරයේ සාමාජිකයන් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් නිදහස් කරනු ලැබිය යුතු ය.

(6) කොන්සල් ධුරයේ සාමාජිකයකු හෝ ඔහුගේ පවුලේ සාමාජිකයකු මිය ගිය විට, තහනම් කර ඇති භාණ්ඩ හැර, ඔහුගේ චංචල දේපළ පිටරටට යැවීම සඳහා බාර ගන්නා රාජ්‍යය අවසර දිය යුතු අතර මිය ගිය තැනැත්තාගේ චංචල දේපළ පැවරීම මත යම් බද්දක් අය නොකළ යුතු ය.

## III වන කොටස

### ශ්‍රී ලංකාවේ වැටුප් නොලබන කොන්සල් ධුරවල මුක්තයන්, පහසුකම් සහ වරප්‍රසාද

පරිශ්‍ර ආරක්ෂා කිරීම.

7ග. වැටුප් නොලබන කොන්සල් නිලධරයකු ප්‍රධානත්වය දරන කොන්සල් ධුරයක් විසින් සිය කර්තව්‍ය ඉටු කරනු ලබන්නේ යම් කොන්සල් පරිශ්‍රයක සිට ද එම කොන්සල් පරිශ්‍රය බාර ගන්නා රාජ්‍යය විසින් ආරක්ෂා කළ යුතු ය.

බදුවලින් නිදහස් කිරීම.

7ඝ. කොන්සල් කර්තව්‍ය ඉටු කිරීමේ දී සිදු කරනු ලබන කටයුතු සම්බන්ධයෙන් යවන රාජ්‍යයේ කොන්සල් පරිශ්‍රය සියලු ජාතික බදුවලින් නිදහස් විය යුතු ය. එසේ වුව ද, එවැනි නිදහස් කිරීමක් සපයන ලද විශේෂිත සේවා සම්බන්ධයෙන් නියම කරනු ලබන ගෙවීම්වලට ව්‍යාප්ත නොවිය යුතු ය.

කොන්සල් රාජ්‍ය ලේඛන අනතුරු හා පීඩා වලින් නිදහස් විය යුතු බව.

7ජ. වැටුප් නොලබන කොන්සල් ධුරයක කොන්සල් රාජ්‍ය ලේඛන සහ ලියකියවිලි අනතුරු හා පීඩාවලින් නිදහස් විය යුතු ය.

රේගු බදුවලින් නිදහස් කිරීම.

7ට. වැටුප් නොලබන කොන්සල් ධුරයේ නිල භාවිතය සඳහා යවන රාජ්‍යය විසින් හෝ එහි ඉල්ලීම පරිදි සපයනු ලබන ගබඩා කිරීමේ හෝ සමාන සේවා සඳහා වන ගාස්තු සහ ගෘහ භාණ්ඩ, උපකරණ, ලේඛන, පොත්, නිල මුද්‍රිත ලිපි ලේඛන සහ සමාන භාණ්ඩ ඔහුගේ පෞද්ගලික ප්‍රයෝජනය සඳහා අදහස් කරනු ලබන්නේ නම්, එම ගෘහ භාණ්ඩ, උපකරණ, ලේඛන, පොත්, නිල මුද්‍රිත ලිපි ලේඛන සහ සමාන භාණ්ඩ සම්බන්ධයෙන් වන ගාස්තු හැර, බාර ගන්නා රාජ්‍යය විසින් ස්වකීය නීතිවලට අනුකූලව සියලුම රේගු බදු, බදු සහ අදාළ ගාස්තුවලින් නිදහස් කරනු ලැබිය යුතු ය.

අපරාධ නඩුවලදී පෙනී සිටීම.

7ඬ. වැටුප් නොලබන කොන්සල් නිලධරයකුට එරෙහිව නඩු කටයුතු පවරනු ලැබූ අවස්ථාවක, ඔහු නිසි බලධරයන් ඉදිරිපිට පෙනී සිටිය යුතු ය. කෙසේ වුව ද, එවැනි නඩු කටයුතු ඔහුගේ නිල තත්ත්වයට නිසි ගරුත්වයක් ඇතිව පැවැත්විය යුතු ය.

වැටුප් නොලබන කොන්සල් නිලධරයන් ආරක්ෂා කිරීම.

7ණ. බාර ගන්නා රාජ්‍යය විසින් වැටුප් නොලබන කොන්සල් නිලධරයකුට ඔහුගේ තත්ත්වයට සරිලන්නා වූ ආකාරයට සියලු ආරක්ෂාව ලබා දිය යුතු ය.

නිදහස් කිරීම්.

7ත. (1) බාර ගන්නා රාජ්‍යයේ දී පිටස්තර පුද්ගලයන් ලියාපදිංචි කිරීම සහ නිවාස අවසර පත්‍ර සම්බන්ධයෙන් වූ යම් බැඳීමකින් කොන්සල් නිලධරයන් සහ කොන්සල් සේවා නියුක්තයන් සහ ඔවුන්ගේ පවුලේ සාමාජිකයන් නිදහස් කරනු ලැබිය යුතු ය.

(2) බාර ගන්නා රාජ්‍යය විසින් සියලුම පෞද්ගලික සේවාවලින් සහ යුධමය වගකීම්වලින් සහ දායක මුදල් ගෙවීමෙන් වැටුප් නොලබන කොන්සල් නිලධරයන් නිදහස් කරනු ලැබිය යුතු ය.

(3) ස්වකීය කොන්සල් කර්තව්‍ය ඉටු කිරීම සඳහා යවන රාජ්‍යයෙන් වැටුප් නොලබන කොන්සල් නිලධරයකුට යම් පාරිශ්‍රමික හෝ දීමනා ලැබෙන්නේ නම් එම පාරිශ්‍රමික හෝ දීමනා සියලු බදුවලින් හා අයකිරීම්වලින් නිදහස් කරනු ලැබිය යුතු ය.

7ඇ සිට 7ඒ දක්වා වූ වගන්තිවල විධිවිධාන මේ කොටසට අදාළ වීම.

7ද. වෘත්තීය කොන්සල් ධුරවලට අදාළ වන මේ පනතේ II වන කොටසේ 7ඇ සිට 7ඒ දක්වා වූ වගන්තිවල විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, වැටුප් නොලබන කොන්සල් ධුරවලට හා ඒවා සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තියට පෙරාතුවම ශීර්ෂය ඇතුළත් කිරීම.

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තියට පෙරාතුවම පහත දැක්වෙන ශීර්ෂය ඇතුළත් කිරීම මගින් ප්‍රධාන ප්‍රඥප්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"IV වන කොටස

සාමාන්‍ය".

**9**. ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර ඒවා ප්‍රධාන ප්‍රඥප්තියේ 8අ සහ 8ආ වගන්ති ලෙස බලාත්මක විය යුතු ය :—

ප්‍රධාන ප්‍රඥප්තියට 8අ සහ 8ආ යන අලුත් වගන්ති ඇතුළත් කිරීම.

"බාර ගන්නා රාජ්‍යයේ නීති සහ නියෝගවලට ගරු කිරීම.

8අ. (1) මේ පනත අදාළ වන තැනැත්තන් විසින් භුක්ති විඳිනු ලබන වරප්‍රසාද සහ මුක්තවලට හානියක් නොවන පරිදි, එවැනි සෑම තැනැත්තකු විසින් ම බාර ගන්නා රාජ්‍යයේ නීති සහ නියෝගවලට ගරු කළ යුතු ය. බාර ගන්නා රාජ්‍යයේ අභ්‍යන්තර කටයුතුවලට මැදිහත් නොවීමට ද ඔවුන්ට කාර්ය භාරයක් පවතින්නේ ය.

(2) කොන්සල් කර්තව්‍ය ඉටු කිරීමට නොගැලපෙන යම් ආකාරයකට කොන්සල් පරිශ්‍රය භාවිත නොකළ යුතු ය.

කොන්සල් නිලධරයන් බාර ගන්නා රාජ්‍යයේ ජාතිකයන් වන විට සීමාසහිත මුක්තිය.

8ආ. බාර ගන්නා රාජ්‍යයේ ජාතිකයන් වන හෝ ස්ථිර පදිංචිකරුවන් වන කොන්සල් නිලධරයන් විසින් සිය කර්තව්‍ය ඉටු කිරීමේ දී කරන ලද නිල ක්‍රියා සම්බන්ධයෙන් අධිකරණ බලයට එරෙහි මුක්තිය සහ පෞද්ගලික අනතුරු හෝ පීඩා සිදු නොකිරීමේ මුක්තිය පමණක් භුක්ති විඳිය යුතු ය.

**10**. "කොන්සල් කර්තව්‍ය" සහ "කොන්සල් නිලධරයා" යන යෙදුම්වල අර්ථ නිරූපණය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අර්ථ නිරූපණ ආදේශ කිරීමෙන් ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :–

ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය සංශෝධනය කිරීම.

"කොන්සල් රාජ්‍ය ලේඛණ" යන්නට කොන්සල් ධුරයට අදාළ සියලු පත්‍රිකා, ලේඛන, ලිපි ගනුදෙනු, පොත්පත්, චිත්‍රපට, ටේප් සහ රෙජිස්ටර සහ සිපර් සහ කෝඩ්, කාඩ් දර්ශක සහ ඒවායේ ආරක්ෂාව සහ තබා ගැනීම සඳහා අදහස් කරනු ලබන යම් ගෘහ භාණ්ඩමය ද්‍රව්‍යයක් ද ඊට ඇතුළත් වේ ;

"කොන්සල් කර්තව්‍ය" යන්නෙන් යම් ලිඛිත නීතියක් මගින් බලය පවරා ඇති යම් කොන්සල් කර්තව්‍යයක් හෝ මෙහි උපලේඛනයේ දක්වා ඇති කොන්සල් කර්තව්‍යයක් සහ ඊට අමතරව මේ පනතේ 3, 4, 5, 6 සහ 7 වන වගන්තිවල සඳහන් යම් කර්තව්‍යයක් අදහස් වේ ;

"කොන්සල් නිලධරයා" යන්නෙන් කොන්සල් කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම භාරව සිටින කොන්සල් ධුරයක ප්‍රධානියා ඇතුලු යම් තැනැත්තෙක් අදහස් වේ ;

"කොන්සල් ධුරය" යන්නෙන් කොන්සල් ජනරාල්, කොන්සල්, උප කොන්සල්, කොන්සල් නියෝජිත ආයතනය හෝ වැටුප් නොලබන කොන්සල්වරයෙක් අදහස් වේ ;

"කොන්සල් පරිශ්‍රය" යන්නෙන් අයිතිය නොතකා කොන්සල් කාර්යාලයේ කාර්ය සඳහා අනන්‍ය ලෙස භාවිත කරනු ලබන ගොඩනැගිලි හෝ ගොඩනැගිලි කොටස් හෝ ඊට අදාළ ඉඩමක් අදහස් වේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**11**. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.